# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2380/15 – 2024 අප්‍රේල් මස 17 වැනි බදාදා – 2024.04.17**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2021/24.

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.06.27 දිනැති හා අංක 2338/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.06.08 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් උළුවිටිකේ, බේරුගොඩ වත්ත,අංක 202/ඒ හි පදිංචි එච්.බී.ජී.රුකුම්තලා මිය ඇතුළු සේවක පිරිස සහ ගාල්ල පහළ ඩික්සන් පාර, අංක 19 හි පිහිටි දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A /50/2023 හා 2023.12.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්. (වැ.බ.)

2024 මාර්තු මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එච්.බී.ජී.රකුම්තලා මිය ඇතුළු සේවක පිරිස, අංක 202/ඒ, බේරුගොඩ වත්ත,උළුවිටිකේ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 19,පහළ ඩික්සන් පාර, ගාල්ල.

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ –

'' දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කරන එච්.බී.ජී.රකුම්තලා මිය ඇතුළු පහත නම් හා ආරම්භක වැටුප සඳහන් සේවකයින් 11 දෙනා හට ලිපිකරු තනතුරේ මූලික වැටුප ලෙස වසර 13ක්, ලබාදී ඇති මෙහි සඳහන් වැටුප් පරිමාණයන් 2019 ජුනි මස සිට මූලික වැටුප රු.13,450/- ක් ලෙස අඩු කර ගෙවීම මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමි විය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

| නම | ආරම්භක මූලික වැටුප |
|---|---|
| 01. තුසිත නලීන් ද සිල්වා | රු.14,610 |
| 02. කපිල මංජුල ඕපාත | රු.14,280 |
| 03. චමිලා දර්ශනී නානායක්කාර | රු.14,280 |
| 04. පද්මලතා නාපගේ | රු.14,610 |
| 05. කේ.කේ. මාලි ප්‍රියන්කා | රු.14,610 |
| 06. එච්.බී.ජී.රකුම්තලා | රු.14,610 |
| 07. මනෝමා ගමගේ | රු.14,280 |
| 08. නෙල්කා ලංකා සමරවික්‍රම | රු.14,610 |
| 09. දිල්හානි අබේසේකර | රු.14,610 |
| 10. ජීවනී සිරිවර්ධන | රු.14,520 |
| 11. නිමේෂිකා උදානි | රු.14,280 |

මෙම කාර්මික ආරාවුල සම්බන්ධයෙන් පැමිණිලිකාර පළමු පාර්ශ්වය අතර හා වගඋත්තරකාර දෙවන පාර්ශ්වය 2023.07.11 දින බේරුම්කරණ අධිකරණය වෙත කැඳවන ලද අතර, ඒ ඒ පාර්ශවයන් පළමු විස්තර ප්‍රකාශනය 2023.08.10 දිනට ලබා දිය යුතු බවත්, එමෙන්ම නැවත පාර්ශව 2023.08.10 දින කැඳවීමටත් නියෝග කෙරුණි. 2023.08.10 දින යලි නඩුකරය කැඳවන ලද අතර, දෙපාර්ශවය පෙනී සිටින ලදී.මෙදින පළමු පාර්ශ්වය විසින් පළමු විස්තර ප්‍රකාශනය ලබා දුන් අතර, දෙවන පාර්ශවය එම විස්තර ප්‍රකාශනය ලබා දීම සඳහා කල් ඉල්ලා සිටින ලදී. නඩුකරය කල් ඉල්ලීම සඳහා ප්‍රමාණවත් හේතු දක්වා නොමැති බව නිරීක්ෂණය විය.එබැවින් දින 10ක් ඇතුළත පළමු විස්තර ප්‍රකාශනය ඉදිරිපත් කළ යුතු බවට දෙවන පාර්ශවයට නියෝග කෙරුණි. මෙහි පළමු පාර්ශ්වයට මෙම නඩුකරය සඳහා පැමිණීමේ පවතින අපහසුතා පිළිබඳව බේරුම්කරණ අධිකාරියෙහි අවධානය යොමු විය. දොළොස් දෙනාගේ කණ්ඩායම් පෞද්ගලික නිවාඩු ලබා ගෙන පැමිණි පසු දෙවන පාර්ශ්වය විසින් කල් ඉල්ලා සිටීම සුදුසු ක්‍රියාපිළිවෙතක් නොවේ. එකම කාර්යාලය දෙපාර්ශවයටම සාකච්ඡා කිරීමට පැවති හැකියාව දෙපාර්ශවයම නිසි පරදි අනුගමනය කොට නොතිබුණි. ඒ අනුව මීළඟ නඩු දිනය දෙපාර්ශ්වය අතර, අදාළ ලේඛන හුවමාරු කර ගැනීමෙන් අනතුරුව කැඳවීමට තීරණය කළෙමි.

2023.09.18 දින පෙ.ව. 9.30ට නඩුකරය යලිත් කැඳවන ලදී. පළමු පාර්ශවය හා දෙවන පාර්ශවය පෙනී සිටින ලදී. දෙවන පාර්ශවය වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජනය ඇත. දෙපාර්ශ්වය පළමු විස්තර ප්‍රකාශන හුවමාරු කරගන්නා ලදී.බේරුම්කරණ අධිකරණයට ලබා දෙන ලදී.සාක්ෂි විමසන අවස්ථාවේදී පළමු පාර්ශවය වෙතින් වෙන වෙනම සාක්ෂි විමසන්නේද? එසේත් නැත්නම් සියලු දෙනා වෙනුවෙන් නියෝජිතයෙකුගෙන් සාක්ෂි විමසන්නේද යන්න ඉදිරියේදී තීරණය කරනු ලැබේ. දෙවන විස්තර ප්‍රකාශන ලබා

දීම හා වැඩිදුර පරීක්ෂණය නැවත 2023.10.17 දින දහවල් 12.30ට නියම කරන ලදී. 2023.10.17 දින දහවල් 12.30 ට මෙම නඩුකරය යලි කැඳවන ලදී. පැමිණිලි පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය පෙනී සිටී. දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් දෙදෙනෙකු ගෙන් සමන්විත වේ.මෙම අවස්ථාවේදී දෙවන විස්තර ප්‍රකාශන හෙවත් ප්‍රති උත්තර හුවමාරු කර ගනී.අද දින සාක්ෂි විමසන බවට පෙර දැනුම් දීම අනුව සාක්ෂි විමසීමට සූදානම් ද විමසා සිටින ලද අතර, පළමු පාර්ශ්වය ඒ සඳහා සූදානම් නොමැති බවත්, දෙවන පිළිතුරු වාර්තා අධ්‍යයනයට අවස්ථා අවශ්‍ය බවත්, කියා සිටී.ලඟ දිනයක් ඉල්ලා ඇත.ඒ අනුව 2023.10.31 දින පෙ.ව. 9.30 ට දින නියම කරමි.එදින සාක්ෂි විමසීමට තීරණය කරන ලදී.

2023.10.31 දින පෙ.ව. 9.30 ට නැවත පරීක්ෂණය ආරම්භ කෙරේ. ඒ අනුව සාක්ෂි විමසීම අරම්භ කෙරේ.පළමු පාර්ශ්වයේ රැකවරණ නිලධාරී පළමු පාර්ශ්වයෙන් සාක්ෂි විමසීම ආරම්භ කෙරේ.X1/X2/X3 සභාගත කෙරේ. මෙහිදී දෙවන පාර්ශ්වයේ නීති නිලධාරී ඉල්ලා සිටින්නේ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනිය අසනීප තත්වයෙන් පසුවන බැවින් ඉදිරි දිනයක් ලබා දෙන ලෙසය. ඒ අනුව 2020.12.18 දින ප.ව.2.30 නඩුකරය කල් තබන ලදී.

බේරුකරණ අධිකරණය 2020.12.18 දින යලි රැස් වූ අතර, මෙදින සාක්ෂි විභාගය ආරම්භ කෙරුණි. මෙදින දෙවන පාර්ශ්වය හෙවත් වගඋත්තරකාර පාර්ශවය විසින් මෙහෙයවන ලද අතර ඉන් අනතුරුව බේරුම්කරණ අධිකරණය විසින් වැඩිදුරටත් සාක්ෂි විමසීම ක්‍රියාත්මක විය. එම සාක්ෂි විභාගයෙන් අනතුරුව පරීක්ෂණය අවසන් කරන්නට යෙදුනි.

**තීන්දු ප්‍රකාශය**

දකුණු පළාත් සභාවේ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙහි සේවයේ නියුතු පැමිණිලිකාර පාර්ශ්වය පළමු කොට කොන්ත්‍රාත් පදනම මත කම්කරු තනතුරුවලට පත්ව ඇත. පසුව එම සේවයෙන් කම්කරු තනතුරෙහි ස්ථිර සේවයට බඳවා ගෙන ඇත. මෙම අධිකාරියෙහි අභ්‍යන්තර උසස් වීම් ක්‍රමවේදය අනුව යලිත් මෙම පැමිණිලිකරුවන් ලිපිකරු 8 ශ්‍රේණියට බඳවා ගෙන තිබුණි. එක් පැමිණිලිකාරියක් වූ නිමේෂිකා උදානි පළමුව බස්නාහිර පළාත් සභාවේ මාර්ග සංවර්ධන අධිකාරියට ලිපිකරු තනතුරකට පළමුව බඳවාගෙන තිබූ අතර, ඇය පසුව ස්ථාන මාරු පදනම මත දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට බඳවාගෙන තිබුණි. ලිපිකරු 8 ශ්‍රේණියට බඳවාගෙන ලබා දී තිබූ වැටුප පසුව සංශෝධනය කොට අඩු කිරීම හේතුවෙන් මෙම කාර්මික අවුල පැන නැගී ඇත.

මෙම බේරුම්කරණයට යොමු වූ ඉල්ලුම්කරුවන්ගේ වැටුප් සංශෝධනය පෙර හා පසු තත්වය පහත දැක්වේ.

| අනු අංකය | නම | කම්කරු තනතුරේ ස්ථිර කල දිනය | ලිපිකරු 8 ශ්‍රේණිය ලබා දුන් දිනය | ගෙවන ලද මූලික වැටුප | *2019.07.15* සංශෝධිත වැටුප |
|---|---|---|---|---|---|
| 01. | තුසිත නලින් ද සිල්වා | 2001.11.26 | 2010.02.01 | රු.14,610 | 13450/- (2010.02.01) |
| 02. | කපිල මංජුල ඕපාත | 2001.11.26 | 2009.01.01 | රු.14,280 | 13450/- (2009.01.01) |
| 03. | චමිලා දර්ශනී නානායක්කාර | 2001.11.26 | 2008.10.01 | රු.14,280 | 13450/- (2009.01.01) |
| 04. | පද්මලතා නාපගේ | 2005.07.01 | 2010.02.01 | රු.14,610 | 13450/- (2010.02.01) |
| 05. | කේ.කේ. මාලි ප්‍රියංකා | 2001.11.26 | 2010.02.01 | රු.14,610 | 13450/- (2010.02.01) |
| 06. | එච්.බී.ජී.රුකුම්තලා | 2001.11.26 | 2010.02.01 | රු.14,610 | 13450/- (2010.02.01) |
| 07. | මනෝමා ගමගේ | 2001.11.26 | 2009.10.01 | රු.14,280 | 13450/- (2009.10.01) |
| 08. | නෙල්කා ලංකා සමරවික්‍රම | 2005.07.01 | 2010.02.01 | රු.14,610 | 13450/- (2010.02.01) |
| 09. | දිල්හානි අබේසේකර | 2005.07.01 | 2010.02.01 | රු.14,610 | 13450/- (2010.02.01) |
| 10. | ජීවනී සිරිවර්ධන | 2005.07.01 | පරිගණක ක්‍රියාකරු 2007.07.15 | රු.14,520 | 13450/- (2009.01.01) |
| 11. | නිමේෂිකා උදනි | 2009.02.02 | 2009.02.02 | රු.14,280 | 13450/- (2009.02.02) |

පැමිණිලිකාර පාර්ශ්ව හෙවත් පලමු පාර්ශ්වය විසින් බේරුම්කරණ අධිකාරිය වෙත ඉදිරිපත් කල යුතු පලමු හා දෙවන විස්තර ප්‍රකාශනය තුළින් තම පැමිණිල්ලට අදාළව පහත සඳහන් කරුණු පැහැදිලි කර ඇත.

01.පැමිණිලිකරුවන් වෙත දෙවන පාර්ශ්වය වන දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පළමුව කම්කරු පත්වීමක් ලබා දී තිබූ අතර ඔවුන් වෙතින් ලිපිකාර තනතුරු වලට අදාළ කාර්යයන් ඉටු කරවා ගෙන ඇත. පසුව 8 වන ශ්‍රේණියේ ලිපිකාර තනතුරු වලට විධිමත් පරිදි පත් කර ඇත. ඊට අනුව රු.14,280/- ක මූලික වැටුපෙහි පිහිටුවා ඇත. වර්ෂ ගණනාවක් අඛණ්ඩව මෙම වැටුප භුක්ති විඳින ලද අතර පසුව මෙම මූලික වැටුප රු. 13,450/- දක්වා දැනටමත් අඩුකර ඇත. තවද එක් පැමිණිලිකාරියක් වන නිමේෂිකා උදානි පළමුව බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියෙහි කළමනාකරණ සහකාර තනතුරකට පත් වී පසුව දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙහි සේවයට බැඳී ඇති අතර ඇය භුක්ති විඳින ලද රු.14,280/- ක මූලික වැටුප ද පසුව  රු. 13,450/- දක්වා අඩුකර ඇත.

02.කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති 30/2006 චක්‍ර ලේඛයෙහි ඡේද අංක 04 යටතේ ප්‍රකාශිත ඇති 2006.01.01 දින සිට 2006.12.31 දක්වා කාලය තුල සේවකයන්ට ගෙවිය යුතු වන වැටුපට වඩා වැඩි වන අවස්ථාවන්හිදී  2006.12.31 දක්වා එකී වැඩි මුදල අදාළ තැනැත්තාට පෞද්ගලිකව වන සේ ගෙවිය යුතු යන කොන්දේසිය හා ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයෙහි 4:8 අනු ඡේදය හා දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත යොමු කල PMS/E2/33/4/211/2 හා 2009.05.28 ලිපියේ 4:3 උප වගන්තියට පටහැනිව නෛතික තත්වය නොසලකා හැර දීර්ඝ කාලයක් පැමිණිලිකරුවන් උපයාගෙන භුක්ති විඳිමින් සිටින සිය වැටුප අඩු කිරීම අසාධාරණ සාධාරණ යුක්ති මූලධර්ම වලට පටහැනි අනීතික ක්‍රියාවලියක් වේ.

03.පැමිණිලිකරුවන් සියලු දෙනාට පොදුවේ බලපාන සිද්ධිමය කරුණු භුක්ති විඳි මූලික වැටුප අඩු කිරීම වේ.දෙවන පාර්ශ්වය පෙන්වා ඇත. ඇතැම් වැටුප් පියවරවල් දෝෂ සහගතව දක්වා ඇති බවට ද පළමු පාර්ශ්වය කරුණු දක්වයි. මෙම වැටුප අඩු කිරීම පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය අතර ඇති කර ගෙන තිබූ ගිවිසුම් වලට පටහැනිය.

04.දකුණු පළාත් ගිණුම්කරණ සභාව විසින් නිලධාරීන් තිදෙනෙකුගෙන් යුත් කමිටුව විසින් නිලධාරීන් පිහිටුවනු ලැබූ වැටුප් තලයන් නිවැරදි නොවන බවට නිරීක්ෂණය කර ඇතත් එම තත්වය තහවුරු කරන කිසිදු ලේඛනයන් නොමැති වීම, එමෙන්ම සෝමසිරි අනුකමිටුව මගින් වැටුප අඩු කරන ලෙසට නිර්දේශයක් කර නොමැති වීම. මෙම සෝමසිරි අනුකමිටුව නිර්දේශ දෝෂ දර්ශනයට පාත්‍ර වී ඇති බවට මේ වන විට එක් පාර්ශවයක් නීතිය ඉදිරියේ හබ කිරීම

බේරුම්කරණ අධිකරණය වෙත දෙවන පාර්ශ්වය හෙවත් වගඋත්තරකාර පාර්ශ්වය වූ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මෙම නඩුකරණයට අදාලව තම පළමු හා දෙවන විස්තර ප්‍රකාශනය තුළින් පහත සඳහන් කරුණු ඉදිරිපත් කරන ලදී.

01.ඉල්ලුම්කරුවන් 11 දෙනාගේ සිද්ධිමය වශයෙන් කරුණු එකිනෙකාට වෙනස් වීම,පත්වීම් දින සමාන නොවීම, උසස්වීම් එකිනෙකට සමාන නොවීම, තනතුරු සමාන නොවීම, වැටුප් පියවරවල් සමාන නොවීම, පැමිණිල්ල එක් එක් ඉල්ලුම්කරුවන් වෙනුවෙන් නඩුකරය පවත්වාගෙන යාම.

02.පැමිණිලිකරුවන් චෙක්රෝල් පදනම මත සේවයට බඳවා ගැනීම, පසුව කම්කරු II වන ශ්‍රේණියේ ස්ථිර කිරීම හා අභ්‍යන්තර උසස්වීම් මත කළමනාකාර සහකාර ( තාක්ෂණික නොවන ) III තනතුරට උසස් කිරීම.

03.පැමිණිලිකරුවන්ට දෝෂ සහගතව ගෙවා ඇති වැටුප් විගණන වාර්තාවට අනුව ගිණුම් සභාව පත් කරන ලද කමිටුව විසින් නිවැරදි ලෙස සංශෝධනය කිරීම.

04.සංශෝධනය කරන ලද වැටුප් පරිවර්තනය අනුව ගෙවීම් කරන ලෙස ආණ්ඩුකාරතුම විසින් 2020.08.13දින අනුමත කිරීම

05.වැටුප නිවැරදි කර ඇති නමුත් 2019 දක්වා ගෙවා ඇති වැඩිපුර වැටුප නැවත අය කර ගැනීමක් සිදු නොකිරීම

06.දෙවන පාර්ශ්වය විසින් සේවකයාට ගෙවා ඇති වැටුප චක්‍රලේඛ විධිවිධාන අනුව නිවැරදි නොවීම හේතුවෙන් එය නිවැරදි කර ගිණුම් කාරක සභාවේ සහ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය පරිදි ගෙවීම නිසා සේවකයන්ට අසාධාරණයක් සිදු නොවීම හා එය අනීතික ක්‍රියාවලියක් නොවීම

2023.10.31 දින හා 2023.12.18 දිනයන්හි තවදුරටත් සාක්ෂි කැඳවීම සිදුකරන ලද අතර පළමු පාර්ශ්වය විසින් එක් පැමිණිලිකරුවෙකු වෙතින් පමණක් සාක්ෂි මෙහෙයවනු ලැබීය. අවසානයේදී බේරුම්කරණය විසින් දෙවන පාර්ශ්වයෙන් තව දුරටත් කරුණු විමසා සිටින ලදී.

ඒ ඒ පාර්ශ්වයන්ගේ විස්තර ප්‍රකාශන හා සාක්ෂි විමසුමට අනුව මෙම නඩුකරයට අදාළව විසඳිය යුතු ප්‍රශ්න පහත සඳහන් පරිදි වේ.

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කරන එච්.බී.ජී. රකුම්තලා මිය ඇතුලු පහත නම් හා ආරම්භක වැටුප් සඳහන් සේවකයන් 11 දෙනා හට ලිපිකරු තනතුරේ මූලික වැටුප ලෙස වසර 13ක් ලබා දී ඇති මෙහි සඳහන් වැටුප් පරිමාණයන් 2019 ජූනි මස සිට මූලික වැටුප රු.13,450ක් ලෙස අඩු කර ගෙවීම මඟින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

| *නම* | *ආරම්භක මූලික වැටුප* |
|---|---|
| 01. තුසිත නලීන් සිල්වා | රු.14,610 |
| 02. කපිල මංජුල ඕපාත | රු.14,280 |
| 03. චමිලා දර්ශනී නානායක්කාර | රු.14,280 |
| 04. පද්මලතා නාපගේ | රු.14,610 |
| 05. කේ.කේ. මාලි ප්‍රියන්කා | රු.14,610 |
| 06. එච්.බී.ජී.රකුම්තලා | රු.14,610 |
| 07. මනෝමා ගමගේ | රු.14,280 |
| 08. නෙල්කා ලංකා සමරවික්‍රම | රු.14,610 |
| 09. දිල්හානි අබේසේකර | රු.14,610 |
| 10. ජීවනී සිරිවර්ධන | රු.14,520 |
| 11. නිමේෂිකා උදානි | රු.14,280 |

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යය මණ්ඩලය සඳහා වැටුප් ප්‍රතිශෝධනය සඳහා වරින් වර නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍ර ලේඛ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු නියෝග බලපානු ලැබේ. කළමනාකරණ සේවා අංක 30 චක්‍ර ලේඛයෙහි විධි විධාන ක්‍රියාත්මක කිරීම දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යන මැයෙන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දකුණු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් ඇමතු DMS/E2/33/4/211/2 හා 2009.05.28 දිනැති ලිපියෙන් ලබා දී ඇති අනුමැතියට මෙහිදී අවධානය යොමු කළ යුතු වේ. එහි ඉතාම පැහැදිලිව දක්වා ඇත්තේ කළමණාකරණ සේවා චක්‍ර ලේඛ 30 හි දක්වා ඇති උපදෙස් වැරදි ලෙස අර්ථකථනය කිරීම හෝ වැරදි ලෙස යොදා ගැනීම හෝ අක්‍රමවත් ලෙස ප්‍රතිශෝධනය කිරීම හෝ වෙනත් වැරදි හේතුකොට ගෙන හෝ සිදුවන ඕනෑම වැඩිපුර ගෙවීමක් ලබා ගත් සේවකයාගෙන් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කිරීමට කල යුතුව යනුවෙනි.

ඒ අනුව රජයේ විගණන වාර්තාව තුළින් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙහි වැටුප ප්‍රතිශෝධනය කිරීමේදී මතු වී ඇති ගැටලු ඉතා පුළුල් වශයෙන් දක්වා ඇත.රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ වැටුප් වැය බර මහා භාණ්ඩාගාරය විසින් දරනු ලැබේ.කාර්යය මණ්ඩල බඳවා ගැනීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු නියෝග හා උපදෙස් බලපානු ලැබේ. එබැවින් එම දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ උපදෙස්වලට අනුව අනුගතව ක්‍රියා කිරීම පළාත් සභා ආයතනයන්හි වගකීම වනු ඇත.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ උපදෙස්, රජයේ විගණන වාර්තාව පළාත් ගිණුම්කාරක සභාව හා එම කාරක සභාව විසින් පත් කළ කමිටුව ලබා දුන් නිර්දේශ වාර්තා පදනම් කොට ගෙන අවසානයේදී දකුණු පළාත් ආණ්ඩුකාරවරයා ද ලබා දී ඇති තීරණය මෙම බේරුම්කරණ අධිකරණය විසින් සැලකිල්ලට ගනු ලැබීය.ඒ අනුව පැමිණිලිකරුවන් හට 2019 ජූනි මස සිට මූලික වැටුප රු.13,450 දක්වා අඩු කර ගෙවීම හුදෙක්ම අසාධාරණ තීරණයක් ද එසේ නැතිනම් පවතින විධි විධානවලට අනුගත වූ තීරණයක් ද යන්න මෙම බේරුම්කරණ අධිකරණයේදී පුළුල් වශයෙන් විමර්ශනයට භාජනය විය.

පැමිණිලිකරුවන් හට 2019 ජූනි මස සිට මූලික වැටුප රු.13,450 දක්වා අඩු කර ගෙවීම පවතින විධිවිධානවලට අනුගතව දෙවන පාර්ශ්වය හෙවත් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ගෙන ඇති නීත්‍යානුකූල තීරණයක් බවට මෙම බේරුම්කරණ අධිකරණයද

තීරණය කරමි.එබැවින් එම්.බී.ජී. රකුම්තලා මිය ඇතුලු සේවකයින් 11 දෙනා ඉදිරිපත් කොට ඇති මුලික වැටුප රු.13,450ක් අඩු කර ගෙවීම මගින් ඔවුන්ට අසාධාරණයක් සිදු වී නැති බවට මෙම බේරුම්කරණ අධිකරණය වැඩිදුරටත් තීරණය කරමි. ඒ අනුව පැමිණිලිකාර පාර්ශ්වයේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව සඳහන් කරමි. ව්‍යවස්ථාපිත හිමිකම් අයදුම් කිරීමට මෙම තිරණය කිසිදු බාධාවක් නොවේ.

**ආචාර්ය කේ.ඒ.තිලකරත්න,**
බේරුම්කරු.

2023 දෙසැම්බර් මස 20 වැනි දින,

EOG 04 - 0141

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.